# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1958/19 - 2016 මාර්තු මස 16 වැනි බදාදා - 2016.03.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* :.MCUDP/LA/ABT(W-05)/14/03.
ඉඩම් *අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/10/2014//LRB/292.

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදුකරනු ලබන උප ව්‍යාපෘතියක් වන උඩුමුල්ල ග්‍රාමයෙහි, මාදිවෙල නැගෙනහිර හැරවුම් ඇලෙහි වම්පස පිහිටි ඉඩම් කොටසක් ඇල ඉවුරු සංරක්ෂණය කිරීම සඳහා පහත විස්තර කර ඇති ඉඩම් කොටස් රජයට පවරාගෙන ඇති බව 1964 අංක 28 දරන ඉඩම් අත්කරගැනීමේ (සංශෝධිත) පනතේ සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*රජයට පවරාගන්නා ලද ඉඩමේ විස්තරය* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 502-උඩුමුල්ල උතුර, ග්‍රාම නිලධාරී කොට්ඨාසයට අයත් උඩුමුල්ල ග්‍රාමයෙහි පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් 2016.03.04 දිනැතිව පිළියෙල කර ඇති අංක කො 9615 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 05 වශයෙන් දක්වා ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.5287 වන පහත විස්තර කර ඇති ඉඩම් කැබලි.

1. කැබලි අංක 01
ඉඩමේ නම: බෝගහවත්ත, ඇලමුල්ල වත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: එන්. එන් පත්බේරිය, අඹතලේ, අංගොඩ; ප්‍රමාණය: හෙක්. 0.1465

2. කැබලි අංක 02
ඉඩමේ නම: අඹතලේවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, තාවකාලික ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: කේ. ඩී. ගුණසේකර, කේ. ඩී. එන්. ආරියරත්න සහ කේ. ඩී. එස්. සිරිවර්ධන, අංක 62, අඹතලේ, අංගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0385

3. කැබලි අංක 03
ඉඩමේ නම: අඹතලේවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: කේ. වී. පී. ගුණසේකර, අංක 62, අඹතලේ, අංගොඩ; ප්‍රමාණය: හෙක්. 0.0005.

4. කැබලි අංක 04
ඉඩමේ නම: අඹතලේවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0014.

5. කැබලි අංක 05
ඉඩමේ නම: සොයාගත නොහැක; වර්තමාන ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: එච්. හේමචන්ද්‍ර පිංතු, අංක 05, අඹතලේ, අංගොඩ; ප්‍රමාණය: හෙක්. 0.3418.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය පැවරූ අයවළුන් හෝ 2016 අප්‍රේල් මස 25 වැනි දින පෙ. ව. 09.30 ට රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 23136 - 26 - (2016/03)

අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ පිහිටා ඇති කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ ඉඩම් අත්කරගැනීමේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 අප්‍රේල් මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම අත්කර ගැනීම සඳහා වන්දි මුදල් ඉල්ලා සිටීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, ඒ සඳහා ඉල්ලා සිටින වන්දි මුදල හා එය ගණනය කළ ආකාරයත්, පිටපත් දෙකක් සහිත ලියවිල්ලක් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

සී. ඩබ්. අබේසූරිය,
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය.

2016 මාර්තු මස 16 වැනි දින.

04 - 234

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.